**කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව - 2021**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය , එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශවලින් 2021 දෙසැම්බර් 31 දිනට කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ මංමාවත්, පාලම් හා බෝක්කු ක්ෂය වටිනාකම රු.228,349,366 ක් වුවද, විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි එය රු.7,679,560 ක් ලෙස දැක්වීමෙන් මූල්‍ය ප්‍රකාශනවල වියදම රු.220,669,806 ක් අඩුවෙන් දක්වා තිබුණි. | පෙර වර්ෂයන්හි මංමාවත්, පාලම් හා බෝක්කුවල ප්‍රත්‍යාගණන වටිනාකම නිසි ලෙස හදුනාගත නොහැකි බැවින් ඉදිරියේ දී සකසන මංමාවත්, පාලම් හා බෝක්කුවල වටිනාකම මත ක්ෂය කිරීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන මෙලෙස ක්ෂය කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | ක්ෂය වටිනාකම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට ගිවිසුම්ගත ලේඛණය අනුව කෙරීගෙන යන වැඩ ගිණුමේ ශේෂය රු.25,382,937 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.31,417,399 ක් ලෙස දැක්වීමෙන් රු.6,034,462 ක් වැඩියෙන් ණය හිමි ශේෂය දක්වා තිබුණි. | 2022 වර්ෂයේ දී මූල්‍ය ප්‍රකාශන සැකසීමේ දී අදාල නිවැරදි කිරීම් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමි. | ණයහිමි වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඇ) | 2021 වර්ෂය තුළදී පරිත්‍යාග ලෙස ලද රු.67,500 ක පුස්තකාල පොත් වටිනාකම ගිණුම්ගතකර නොතිබුණි. | 2022 වර්ෂයේ දී මූල්‍ය ප්‍රකාශන සැකසීමේ දී අදාල නිවැරදි කිරීම් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමි. | පුස්තකාල පොත් පරිත්‍යාග නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2020 වර්ෂයේදී ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන වෙනුවෙන් 2021 වර්ෂයේදී ක්‍රමක්ෂය කළයුතු වටිනාකම රු.8,157,566 ක් වුවද, විස්තීරණ ආදායම් ප්‍රකාශනය තුළ එය රු.5,493,069 ක් ලෙස දැක්වීමෙන් රු.2,664,497 කින් වර්ෂයේ අයභාරය අඩුවෙන් දක්වා තිබුණි. | ක්‍රමක්ෂය වසරේ ප්‍රාග්ධන ප්‍රදාන එම වර්ෂයේ ම විස්තීර්ණ ආදායම් හඳුනාගැනීම සිදුකරන බැවින් 2020 හා 2021 ප්‍රාග්ධන ප්‍රදාන හඳුනාගෙන ගණනය කිරීම සිදුකර ඇත. | 2019 දෙසැම්බර් 24 දිනැති අංක 2155/8 දරන පළාත් සභා ගැසට් පත්‍රයේ 194 වගන්තියෙහි උපදෙස ප්‍රකාරව අදාල ගැලපීම් නිවැරදිව සිදුකළ යුතු වේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුලදී සහා බල ප්‍රදේශයේ මහා මාර්ග පුළුල් කිරීම වෙනුවෙන් සභාව වෙත ලැබුණු වන්දි මුදල් රු.33,135,650 ක් වෙනත් ආදායම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට සංචිත හා වෙන්කිරීමේ ගිණුමට බැර කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශන සකසන අවස්ථාවේදී වන්දි මුදල් ලැබීමට අදාලව වත්කම්වල වටිනාකම නිසි ලෙස හඳුනාගෙන නොතිබූ අතර 2022 වර්ෂයේ දී මූල්‍ය ප්‍රකාශන සැකසීමේ දී අදාල නිවැරදි කිරීම් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමි. | නිවැරදි ලෙස ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඊ) | 2020 වර්ෂයේ ප්‍රාග්ධන ආධාර යටතේ දරන ලද ළමා උද්‍යාන වැය රු.4,487,891 ක් ගිණුම්ගත නොකිරීම හේතුවෙන් වත්කම් රු.4,487,891 ක් අඩුවෙන් හා ක්ෂය රු.448,789 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2022 වර්ෂයේ දී මූල්‍ය ප්‍රකාශන සැකසීමේ දී අදාල නිවැරදි කිරීම් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමි. | සභාවේ ස්ථාවර වත්කම් හා ක්ෂය නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (උ) | සභාවට අයත් ටී.බී. ඉලංගරත්න ක්‍රීඩාංගණයේ ප්‍රේක්ෂකාගාරයේ සිවිලිම හා වැහිපීළි ගැසීම වෙනුවෙන් වැය කරන ලද රු.1,325,367 ක් දේපළ, පිරියත හා උපකරණ යටතේ වත්කමක් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට පුනරාවර්තන වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | එම | වත්කම් නිසිලෙස හඳුනාගෙන එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ යටතේ නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ විස්තීරණ ආදායම් ප්‍රකාශය අනුව ක්ෂය වටිනාකම රු.27,916,190 ක් වුවත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ එය දක්වා නොතිබුණි. | එම | ක්ෂය කිරීම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (එ) | වර්ෂය තුළදී ස්ථාවර වත්කම් මිලදී ගැනීම් රු.93,324,906 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ එය දක්වා නොතිබුණි. | එම | ආයෝජන ක්‍රියාකාරකම් යටතේ නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඒ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ රු.138,640,414 ක් විය යුතු වුවද, සියළු ගැලපීම් සිදුකළ පසු අවසාන ශේෂ එකතුව රු.212,623,735 ක් වන බැවින් රු.73,983,321 ක වෙනසක් පවතින බව නිරීක්ෂණය විය. | එම | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඔ) | වර්ෂය තුළදී ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් රු.40,279,099 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ දක්වා නොතිබුණි. | එම | ප්‍රාග්ධන ලැබීම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 03 කට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම හා උපලේඛන අනුව වටිනාකම අතර රු.77,275,778 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ලේඛන හා උපලේඛන නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ අයභාරය රු.75,111.697 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන ආදායම ඉක්මවූ වියදම රු.645,242,866 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය පෙර වර්ෂය හා සාපේක්ෂව රු.720,354,563 කින් වර්ධනය වී තිබුණු බව නිරීක්ෂණය විය.

## 2.2 හිඟ ආදායම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් බදු** | | |
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟහිටි වරිපනම් හා බදු වටිනාකම රු.60,673,270 ක් වූ අතර එයින් රු.40,000 කට වඩා වැඩි හිඟ වටිනාකමක් ඇති වරිපනම් හිඟ ශේෂ 25 කින් අයවිය යුතුව තිබූ මුදල රු.5,035,656 ක් විය. | මෙම හිඟ හිටි වරිපනම් මුදලින් රු. 1,596,585ක් රජයේ දේපළ වන අතර, එය මුළු හිඟ මුදලින් 2.6% ක් පමණ වේ. අදාළ රාජ්‍ය ආයතන හා පළාත් පාලන ආයතන ද දැනුවත් කර ඇත. මේ වන විට දේපළ දෙකක් මුළු හිඟය සම්පූර්ණයෙන්ම ගෙවා අවසන් කර ඇති අතර, ඉතිරි හිඟ මුදල් කොටස් වශයෙන් ගෙවීම් කටයුතු සිදු කරන බැව් ද කාරුණිකව දන්වමි.<br>2020 හා 2021 වර්ෂ වලදී සාපේක්ෂව රටේ පැවති කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන්, සංචරණ සීමා පැනවීම හා කාර්යාල වසා තැබීම ආදී ක්‍රියාකාරීකම් හේතුවෙන් ආදායම් වැඩි කර ගැනීමට කටයුතු කිරීමට නොහැකි විය. මේ වන විට වරිපනම් ජංගම වැඩසටහන් , දේපළ තහනම් නිලධාරීන් යොදවා දේපළ තහනමට ගැනීම මඟින් හිඟ ආදායම් අයකර ගැනීමට බලාපොරොත්තු වේ. | වර්ෂ ගණනාවක සිට අයවිය යුතුව පවතින හිඟ ආදායම් රැස්කිරීම කඩිනම් කළ යුතු වේ. |
| **(ආ) කඩ කුලී** | | |
| සමාලෝචිත වර්ෂයේදී කඩ කාමර 33 කින් අයවිය යුතු මුළු හිඟ කුලිය වූ රු.5,244,196 කින් කිසිඳු කඩකුලී මුදලක් අයවී නොතිබුණි. | 2019 වසරේ නව කඩ කුලී ප්‍රතිශෝධනය කිරීම මත පෙර පැවති තක්සේරුව මත 300%කින් පමණ වැඩි වීම හේතු කොට ගෙන බදුකරුවන් මෙම කුලී ගෙවීම පැහැර හැර ඇත. ඔවුන් විසින් කුලී ප්‍රතිශෝධනය සංශෝධනය කර දෙන ලෙස ඉල්ලා ඇති අතර, ඒ අනුව ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යොමු කර ඇත. ආණ්ඩුකාරතුමා විසින් තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර සංශෝධන ලබා ගන්නා ලෙස | කඩ කුලී ගෙවීම පැහැර හරින්නන්ගේ කඩ කාමර ආපසු පවරා ගැනීම වැනි විකල්ප ක්‍රම මගින් හිඟ කඩකාමර කුලී අයකර ගැනීම කඩිනම් කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| | දන්වා ඇති අතර, තක්සේරු දෙපාර්තමේන්තුව විසින් කුලී ප්‍රතිශෝධන 10%කින් අඩු කර එවා ඇති නමුත්, ඒ පිළිබඳවද බදුකරුවන් සෑහීමකට පත් වී නොමැත. මෙම කරුණු පිළිබඳව දිනෙන් දිනම බදුකරුවන් හා සභාවද සාකච්ඡා කරන ලද අතර, අවසානයේ මහ සභාවේ යෝජනා සම්මතයක් මගින් මෙම ප්‍රතිශෝධන මුදල කොටස් වශයෙන් අය කර ගැනීමට තීරණය වී ඇත. | |

**(ඇ) උසාවි දඩ**

----------

| | | |
|---|---|---|
| පසුගිය වසර 05 ක සිට සභාවට කිසිදු උසාවි දඩ ආදායමක් ලැබී නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසාන දිනට උසාවි දඩ රු.11,410,860 ක් ලැබිය යුතුව තිබුණි. | පසුගිය වර්ෂයන්ට අදාළව සභාවට ලැබිය යුතු උසාවි දඩ සම්බන්ධයෙන් පරීක්ෂා කර ඊට අදාළ වාර්තා නැවත පරීක්ෂා කිරීමට කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය වෙත යොමු කර ඇති අතර, අධිකරණය විසින් මෙතෙක් එකී වාර්තා පරීක්ෂා කර අදාළ මුදල් සභාව වෙත යොමු නොකිරීම මත මෙම ගැටළුව මතුව ඇත. | කාලය ඉක්ම යාමට පෙර ලැබිය යුතු උසාවි දඩ මුදල් අයකර ගැනීම කඩිනම් කළ යුතු වේ. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 3.1 හඳුනාගත් පාඩු

----------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 ජුනි 11 වන දින අංක LK 4339 දරන ටිපර් රථය අනතුරට ලක් වී විදුලි කණුවකට හානි වී තිබුණු අතර විදුලි කණුවට සිදු වූ හානිය වෙනුවෙන් සභාව විසින් රු.108,805 ක් ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවා තිබුණි. නමුත් අනතුර සිදුවන අවස්ථාව වන විට ටිපර් රථයේ රියදුරුගේ රියදුරු බලපත්‍රය කල් ඉකුත් වී ඇති බැවින් රක්ෂණ ආයතනය මගින් අලාභය ආවරණය කර ගැනීමට නොහැකි වී තිබුණි. කොරෝනා වසංගතය උග්‍ර | ටිපර් රථය විදුලි කණුවක ගැටීමෙන් ටිපර් රථයට හානියක් සිදුවී නොමැති අතර, විදුලි කණුවට වූ හානිය සඳහා රු.108,805.00ක මුදලක් ලංකා විදුලි බල මණ්ඩලය විසින් ඇස්තමේන්තු කර තිබුණි. 2020 මාර්තු මස සිට කොරෝනා වසංගත තත්ත්වය පැවති වකවානුවේ රියදුරු මහතාගේ බලපත්‍රයද කල් ඉකුත් වී තිබුණි. අදාළ බලපත්‍රය අළුත් කිරීම සඳහා | නියමිත වේලාවට රියදුරු බලපත්‍ර, රක්ෂණ ආවරණ සහතික ලබාගැනීම හා වාහන පාලනය සම්බන්ධව මුදල් රෙගුලාසි උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| පැවති අවස්ථාවන්හිදී රජය විසින් රියදුරු බලපත්‍ර කල් ඉකුත්වන පුද්ගලයන් සඳහා රියදුරු බලපත්‍රවල වලංගු කාලසීමාව දීර්ඝ කර තිබුණි. නමුත් එම මුදල අදාළ රියදුරුගෙන් හෝ රියදුරුගේ බලපත්‍රය පරීක්ෂා නොකළ නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව හා වෛද්‍ය සහතික ලබා දෙන ආයතන වසා ඇති බැවින්, රියදුරු බලපත්‍ර නිකුත් කිරීම දින නියමයක් නොමැතිව අත්හිටුවා තිබූ බැවින්, රියදුරු මහතාට බලපත්‍රය අළුත් කර ගැනීමට නොහැකි විය. විදුලි කණුවේ අලාභය කඩිනමින් ගෙවන ලෙස මුල්ලේරියාව පොලීසිය විසින් දැනුම් දුන් අතර, ඒ අනුව 2021.07.14 දින පැවති මාසික මහ සභාවේ අංක උ(iv)70 යටතේ වූ අනුමැතිය යටතේ ලංකා විදුලි බල මණ්ඩලයට මුදල් ගෙවා ඇත. පසුව එම අලාභය ශ්‍රී ලංකා රක්ෂණ සමාගමෙන් අය කර ගැනීමට අදාළ ලිපි ලේඛන ද භාර දී ඇති නමුත්, ඒ සඳහා අවශ්‍ය රියදුරු බලපත්‍රය මේ දක්වා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් නිකුත් කර නොමැති බැවින් එය ප්‍රමාද වී ඇත. | |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)කොට්කාවත්ත කසළ අංගනයේ එක්රැස්වෙන කසළ තුනී කිරීම හා එම කසළ වැසීම සඳහා D6H වර්ගයේ චේන් ඩෝසර් යන්ත්‍රයක සේවය කුලී පදනම මත පෞද්ගලික ආයතනයකින් ලබාගෙන තිබුණු අතර ඒ සඳහා 2018 සැප්තැම්බර් සිට 2021 දෙසැම්බර් මාසය දක්වා කුලී වශයෙන් රු.30,676,250 ක් ගෙවා තිබුණි. දෛනිකව එකතු කරනු ලබන දිරන කසළ ටොන් 30 - 35 ප්‍රමාණයෙන් ටොන් 05 ක් පමණක් කොම්පෝස්ට් නිපදවීම සඳහා යොදාගනු ලබන අතර ඉතිරි ප්‍රමාණය සහ නොදිරන කසළ ටොන් 20 - 25 | දිනකට කසළ අංගනයට කසළ ටොන් 50-60ක් අතර ප්‍රමාණයක් එක්වන අතර, ඉන් දිරන කසළ ටොන් 05ක් කොම්පෝසට් කරණයට යොදා ගැනේ. දිනකට එකතු වන කසළ කොම්පෝස්ට් හැරුණු විට ඉතිරි ටොන් 35 ක ප්‍රමාණය විවෘත භූමියට මුදා හැරේ. එම කසළ ප්‍රමාණය දිනපතා තල්ලු කිරීම කල යුතු වන අතර, එක් දිනකින් එසේ කිරීමට කල නොහැකි අවස්ථාවලදී කසළ කන්දක් එම භූමියේ ඉදිවේ. එබැවින් මෙම කුණු තල්ලු කිරීම අත්‍යවශ්‍ය කරුණකි. 2018 සිට D6H චේන් ඩෝසරය භාවිතා කරන අතර, ඊට ප්‍රථම D4 වර්ගයේ | සභාවේ කසළ කළමනාකරණය නිසි අයුරින් සිදු කරමින් වියදම් අවම කරමින් සභාවට ආදායම් ඉපයීම හා ප්‍රදේශ වාසීන්ට පරිසර හිතකාමී වාතාවරණයක් නිර්මාණය කිරීමට සභාව කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| අතර ප්‍රමාණයක් සහ මිශ්‍ර කසළ ටොන් 10 ක් වශයෙන් දෛනිකව එකතුවන ටොන් 45 – 65 පමණ කසළ ප්‍රමාණයක් කොම්පෝස්ට්කරණය හෝ ජීව වායුව නිපදවීම සඳහා යොදා නොගැනීම හේතුවෙන් මෙලෙස කසළ තුනී කිරීම සහ එම කසළ වැසීම සඳහා අතිරේක වියදමක් දැරීමට සිදු වී තිබුණි. | වේන් ඩෝසරය භාවිතා කර ඇත. එම කාර්යය සඳහා වේන් ඩෝසරයක් අත්‍යවශ්‍ය වන අතර, කරුණු ගණනාවක් මත එය සභාවට මිලදී ගැනීමට හැකියාවක් නොමැති බැව් කාරුණිකව පෙන්වා දෙමි. කරුණු සියල්ල පිළිබඳව සලකා බලා කුලී පදනම මත මහා සභා අනුමැතිය යටතේ මෙම සේවාව ලබා ගන්නා බව කාරුණිකව දන්වමි. | |
| (ආ) 2021 නොවැම්බර් 09 දින වේන් ඩෝසරයේ මීටරය අනුව අංක 9,895.1 ක් ලෙස දැක්වුවද ඊට පෙර වැඩකළ අවසාන දිනය ලෙස 2021 ඔක්තෝබර් 29 දින මීටර් අංක 2,099.8 ක් ලෙස සහ පැය 5.2 ක් එදින වැඩකර ඇති බවට අංක 48649 දරන ධාවන සටහන් අනුව නිරීක්ෂණය විය. තවද 2021 ඔක්තෝබර් 29 දිනෙන් පසුව වැඩකර ඇත්තේ 2021 නොවැම්බර් 09 දින පමණක් බව නිරීක්ෂණය විය. මෙම කාල පරාසය තුළ වැඩකළ බවට වැඩ පරිපාලක ප්‍රකාශ කළද ඊට අදාළ සාක්ෂි එම ස්ථානයේ නොතිබුණි. | කසළ අංගනය ඔක්තෝම්බර් 29න් පසු වැඩ කර ඇති බව පවසමි. නමුත් ඒ පිළිබඳව ලිඛිත සටහනක් නොවූ බව කාරුණිකව දන්වමි. එම අඩුපාඩුව මගහරවා ලිඛිත සටහන් තැබීමට අවශ්‍ය පියවර ගෙන ඇති බැව් කාරුණිකව දන්වා සිටිමි. | සභාව සතු සම්පත් භාවිතයේදී ඒ පිළිබඳ අවශ්‍ය ලිඛිත සාක්ෂි සහිතව විනිවිදභාවයෙන් කටයුතු කළයුතු වේ. |